# ඩබ්ලිව්. එම්. රණතුංග එ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/1536/19 (2020.01.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ-ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - ඩබ්ලිව්.එම්. රණතුංග

**නොතිසි ලත් පාර්ශවය**- නම්කළ නිලධාරි,කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**

අභියාචක - ඩබ්ලිව්.එම්. රණතුංග
පොදු අධිකාරිය - එම්.එම්.කේ. වීරවර්ධන, නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.03.19 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2019.04.17 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.04.18 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2019.05.23 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.06.01 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු**:

අභියාචක 2019.03.19 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *බී.ඒ.එස්. ගුණසේකර මහතා අයතා ලෙස විදේශ ශිෂ්‍යත්ව ලබාදීම සම්බන්ධව පරීක්ෂණ වාර්තාවේ පිටපතක්.*
2. *එම පරීක්ෂණය අනුව ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද යන්න විස්තර සහිතව.*

මෙම ඉල්ලීමට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරී විසින් 2019.04.17 දිනැතිව දන්වා එවන ලද්දේ අභියාචක විසින් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලා ඇති බී.ඒ.එස් ගුණසේකර මහතාට විදේශ ශිෂ්‍යත්ව ලබා දීම සම්බන්ධයෙන්, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අංක බී.සී 0965/2018/බී 08 යටතේ විමර්ශයක් පැවැත්වෙන බැවින් එහි වාර්තාව ලැබුණු පසු අභියාචක විසින් ඉල්ලා ඇති පරීක්ෂණ වාර්තාවේ පිටපතක් අභියාචක වෙත එවීම පිළිබඳ අවධානය යොමු කරන බව කාරුණිකව දන්වන බවත්ය. මින් අතෘප්තියට පත් අභියාචක විසින් විසින් 2019.04.18 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. නම්කළ නිලධාරියා විසින් 2019.05.23 දිනැතිව දන්වා එවන ලද්දේ අභියාචක විසින් ඉල්ලා ඇති අයතා විදේශ ශිෂ්‍යත්ව ලබාදීම වෙනුවෙන් බී.ඒ.එස් ගුණසේකර මහතාට දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද පරීක්ෂණය තවදුරටත් පරීක්ෂණ මට්ටමේ තිබෙන බැවින් එය ලබා දීමට නොහැකි බවය. මින් අතෘප්තියට පත් අභියාචක 2019.06.01 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

මෙහිදී අභියාචක විසින් කරුණු දක්වා සිටින ලද්දේ අදාළ තොරතුරු සම්බන්ධව අමාත්‍යාංශය විමසීමේදී එම වාර්තාව අමාත්‍යාංශය සතුව නොමැති බවත් එය අදාළ දෙපාර්තමේන්තුව සතුව පැවතිය යුතු බව අමාත්‍යාංශය විසින් තමන්ට වාචිකව සඳහන් කළ බවයි.

මෙහිදී කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියට අවධාරණය කර සිටිනුයේ පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරියා විසින් ලබාදුන් පිළිතුරු එකිනෙකට ප්‍රතිවිරුද්ධ වන බවත් විශේෂයෙන්ම නම්කළ නිලධාරියාගේ ප්‍රතිචාරයෙන් අදාළ පරීක්ෂණය තවමත් පරීක්ෂණ මට්ටමේ පවතින බවට වන අර්ථයක් ඉස්මතු කරන බවයි.

**නියෝගය:**

මෙම සියලු කරුණු සළකා බලමින් අදාළ පරීක්ෂණ වාර්තාවේ දිනය, එය අමාත්‍යාංශයට යොමුකළ ලිපිය හා දිනය මෙන්ම ඒ සම්බන්ධව ගත් පියවර යනාදී පරීක්ෂණ වාර්තාවේ තොරතුරු මීළඟ අභියාචනා දිනයේදී කොමිෂන් සභාවට රැගෙන එන ලෙසට පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

මීළඟ අභියාචනා විභාගය 2020.04.28 දින ප.ව. 2.30ට කල්තබන ලදි.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

---

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 1536/2019 (2020.06.30 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - ඩබ්ලිව්. එම්. රණතුංග
**නොතිසි ලත් පාර්ශවය**- නම්කළ නිලධාරි, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

## පෙනීසිටීම

මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

රට තුල COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

## නියෝගය:

2020.01.07 දින කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නියෝගයට පොදු අධිකාරියේ අවධානය යොමු කරන අතර, එම නියෝගයට අනුගත වීමට හා ප්‍රතිචාර දැක්වීමට මින් නියෝග කරන ලැබේ. තවද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39(1)(ඉ) යන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හැරීම හා ප්‍රතික්ෂේප කිරීම නීතිමය වරදක් වන බවටද පොදු අධිකාරියට මින් අවධාරණය කරනු ලැබේ.

එම 39(1)(ඉ) යන වගන්තිය නම්,

*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය*

*කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තෙකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතුය.*

අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 21.07.2020

සැලකිය යුතුයි: 21.07.2020 දින කැඳවීමට තිබු මෙම අභියාචනය 25.08.2020 දිනට කල් තබන ලදී.

---

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 1536/2019 (2020.09.02 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - ඩබ්ලිව්. එම්. රණතුංග
**නොතිසි ලත් පාර්ශවය**- නම්කළ නිලධාරි, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**

මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටින ලද්දේ 2020.06.30 දිනැති නියෝගය ප්‍රකාරව පොදු අධිකාරිය විසින් ක්‍රියාකර නොමැති බවයි.

**නියෝගය:**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39(1)(ඉ) යන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හැරීම හා ප්‍රතික්ෂේප කිරීම නීතිමය වරදක් වන බවටද පොදු අධිකාරියට මින් අවධාරණය කරනු ලැබේ.

එම 39(1)(ඉ) යන වගන්තිය නම්,

> *කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තෙකු ම මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතුය.*

ඒ අනුව මෙම අභියාචනයේ කරුණු සළකාබලමින් පුද්ගලික වශයෙන් කැඳවා විභාග කිරීමට මෙම අභියාචනය 2020.11.10 දින පෙ.ව. 10.30ට කල්තබනු ලැබේ.

එදිනට පොදු අධිකාරියේ හා අභියාචකගේ පැමිණීම අනිවාර්ය බව නියෝග කරනු ලැබේ. අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 2020.11.10 දින පෙ.ව. 10.30ට

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*******